අනුරාධපුර මහා නගර සභාව
අනුරාධපුර දිස්ත්‍රික්කය

-----------------------------

01. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 අගෝස්තු 27 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 22 දින ද සභාවට යවා ඇත.

1.2 අහිතකර මතය

මෙම වාර්තාවේ අහිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට අනුරාධපුර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 අහිතකර මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ස්ථාවර තැන්පතු ඇපයට තබා සමාලෝචිත වර්ෂයේ ලබාගෙන තිබුණු රු.14,400,000 ක ණය මුදලේ බැර ශේෂය වූ රු.12,969,209 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | එකඟ වෙමි. |
| (ii) | කසළ දහනාගාරයක් ඉදිකිරීමේදී කාර්ය සාධන බැඳුම්කරයක් මගින් ලැබී තිබුණු රු.4,250,000 මුදල මධ්‍යම රජයෙන් ලැබුණු ප්‍රාග්ධන ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | එකඟ වෙමි. |
| (iii) | 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා සහ 2014 වර්ෂයේ සිට 2018 වර්ෂයේ ජුනි මාසය දක්වා කාලපරිච්ඡේදවල සිදුවී තිබුණු මූල්‍ය අක්‍රමිකතාවලට වගකිව යුතු පාර්ශවයන්ගෙන් සභාවට අයවිය යුතු පිළිවෙලින් රු.6,322,303 ක හා රු.40,852,190 ක වටිනාකම් ගිණුම්ගත කර නොතිබුණි. | මුදල් අයකරගත යුතු පාර්ශවයන් හඳුනාගෙන වටිනාකම් ගිණුම්ගත කළ යුතුවේ. | විමර්ශන වාර්තාව අනුව නිවැරදි වටිනාකම ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | අනුරාධපුර මහා නගර සභාවේ සේවය කර 2013 අගෝස්තු මස පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවට ස්ථානමාරු වී ගොස් තිබුණු සේවකයකුට 2018 ජුනි මාසය දක්වා අවිධිමත් ලෙස ගෙවා තිබුණු රු.1,816,557 ක වැටුප් හා දීමනා ලැබිය යුතු වටිනාකමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | මුදල් අයකරගත යුතු පාර්ශවයන් හඳුනාගෙන වටිනාකම් ගිණුම්ගත කළ යුතුවේ. | විමර්ශන වාර්තාව අනුව හඳුනා ගන්නා වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (v) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ලංකා බැංකුවේ ණය වාරික සහ පොලී ගෙවීම් රු.2,607,434 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | එකඟ වෙමි. |
| (vi) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මහා නගර සභාවට අයත් ජංගම ගිණුම 02 කට අදාළ රු.4,788,730 ක ගෙවීම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ බැංකු සැසදුම් ප්‍රකාශන හා මුදල් ශේෂ තුල ගැලපීම් කර ඇත. ගැලපීම් වලට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (vii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම ගිණුම් 04 කට ලැබී තිබුණු රු.1,839,183 ක් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ බැංකු සැසදුම් ප්‍රකාශන හා මුදල් ශේෂ තුල ගැලපීම් කර ඇත. ගැලපීම් වලට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (viii) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිතා කර තිබුණු ජ'නල් සටහන් 13 ක රු.151,314,830 ක හර වටිනාකම් සහ රු.86,378,799 ක බැර වටිනාකම් අදාළ ගිණුම්වල දැක්වීම වෙනුවට රු.64,936,031 ක හර වෙනසෙහි වටිනාකම වෙනත් වියදම් ලෙස දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි මූල්‍ය ප්‍රකාශනය තුල ගිණුම් වර්ෂයට අදාලව සිදුවනන ජ'නල් සටහන් මඟින් දක්වා ඇති ගනුදෙනු මූල්‍ය ප්‍රකාශන වල සටහන් කිරීමේදී අදාල ආදායම් වියදම් හා වත්කම් වගකීම් ගිණුම් තුලම සටහන් කිරීමට කටයුතු කරමි. |
| (ix) | ප්‍රධාන කාර්යාලය, පුස්තකාල ගොඩනැගිලි, ආදාහනාගාරය, අනෙක් ගොඩනැගිලි ඒකක 135 ක් සහ සියළුම ඉඩම්වල වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | අදාළ වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුවේ. | වටිනාකම් නව ගිණුම්කරණ ප්‍රමිත අනුව 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ඇතුළත් කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (x) | නිකුත් කළ නමුත් ඉකුත් වර්ෂ ගණනාවක සිට ගෙවීමට ඉදිරිපත් නොකල ජංගම ගිණුම් 02 කට අදාළ රු.2,188,931 ක් වූ චෙක්පත් වටිනාකම් සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | මෙම චෙක්පත් වටිනාකම වියදම් අධිහාර ශීර්ෂයට මාරුකිරීම් යටතේ නිවැරදි කර ඇත. |
| (xi) | වෙනත් ආයතන ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කර තිබුණු රු.5,907,104 ක් වටිනා ව්‍යාපෘති 09 ක් ණයහිමියන් ලෙස දක්වා තිබුණු නමුත් ලැබිය යුතු ණය ගැති වටිනාකම ගිණුම් ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල කර්මාන්ත ණයගැති හා ණයහිමි ගිණුම් ඇතුළත් කිරීමට කටයුතු කරමි. |
| (xii) | සමාලෝචිත වර්ෂයේ සතිපොල ආදායම රු.7,791,314 ක් මූල්‍ය ප්‍රකාශනවල රු.7,545,975 ක් ලෙස දක්වා තිබීම නිසා රු.245,339 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල මුදලින් ලැබීම් පමණක් සටහන්කර ඇත. හිඟ ලැබීම් ගිණුම්ගතවී නොමැත. ජ'නල් සටහන් මඟින් මෙම නිවැරදි කිරීම් සිදුකර ඇත. |
| (xiii) | සමාලෝචිත වර්ෂයේ ටෙන්ඩර් කළ රථගාල් බදුදීම් සහ සභාව මඟින් පවත්වාගෙන ගොස් තිබුණු රථගාල්වල ආදායම රු.7,073,299 ක් මූල්‍ය ප්‍රකාශනවල රු.5,695,893 ක් ලෙස දක්වා තිබීම නිසා රු.1,377,406 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | මූල්‍ය ප්‍රකාශනය අනුව නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන රථ ගාල් සඳහා ලැබුණු ආදායම 2,260,440 කි. රථගාල් බදු දීම් මඟින් ලද ආදායම 3,435,452 කි. |
| (xiv) | සමාලෝචිත වර්ෂයේ මාළුකඩ ටෙන්ඩර් බිල්කල ආදායම් රු.1,510,770 ක් මූල්‍ය ප්‍රකාශනවල රු.3,389,152 ක් ලෙස දක්වා තිබීම නිසා රු.1,878,382 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ මාළු කඩ ටෙන්ඩර් ලේඛනය අනුව මාළු කඩ සඳහා බිල් කළ ආදායම නිවැරදි කර ඉදිරිපත් කරමි. |
| (xv) | සමාලෝචිත වර්ෂයේ පොසොන් සැණකෙලි බිල්කල ආදායම රු.20,658,539 ක් මූල්‍ය ප්‍රකාශනවල රු.21,853,522 ලෙස දක්වා තිබීම නිසා රු.1,194,983 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල දක්වා ඇති පොසොන් සැණකෙළි ආදායම, ආදායම් වාර්තා අනුව නිවැරදි වේ. අදාල උපලේඛන සකස් කර ඉදිරියේදී විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (xvi) | සමාලෝචිත වර්ෂයේ විවිධ අත්තිකාරම් පියවීම් රු.2,988,781 ක් අදාළ වියදම් ගිණුම්වලට හර කිරීම වෙනුවට මුදල් පාලන ගිණුමට හර කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ගිණුම් අංක 1847 ට අදාල හරස් සටහන් ලැබීම් මුදල් ශේෂය තුල ඇතුලත් වී නොමැත. එම නිසා අත්තිකාරම් පියවීම හරස් සටහන් මඟින් මුදල් පොතේ ශේෂයට ගැලපීම් කර ඇත. |
| (xvii) | දේශීය ණය සංවර්ධන අරමුදලේ සමාලෝචිත වර්ෂයේ ණය පොලී රු.2,943,731 ක් මූල්‍ය ප්‍රකාශනවල රු.2,447,323 ක් ලෙස දක්වා තිබීම නිසා රු.496,408 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | දේශීය ණය සංවර්ධන අරමුදලේ ණය ශේෂ වාර්තා හා මූල්‍ය ප්‍රකාශනය අනුව ණය ශේෂ පොලී මුදල සසඳා බලා වෙනස්කම් ඇතොත් ඉදිරි මූල්‍ය ප්‍රකාශන තුල නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (xviii) | විවිධ අත්තිකාරම් ගෙවීම් රු.2,165,800 ක් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගතවීමේ වරද සමාලෝචිත වර්ෂයේ නිවැරදි කිරීමේදී අදාළ පුනරාවර්තන වියදම් ගිණුම් බැර කිරීම වෙනුවට මුදල් පාලන ගිණුම බැර කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | එකඟ වෙමි. |
| (xix) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.2,365,599 ක් මූල්‍ය ප්‍රකාශනවල රු.3,115,094 ක් ලෙස දක්වා තිබීම නිසා රු.749,495 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | එකඟ වෙමි. |
| (xx) | සමාලෝචිත වර්ෂයේ මළ බැහැර කිරීමේ බදු බිල්කළ ආදායම් රු.10,242,725 ක් මූල්‍ය ප්‍රකාශනවල රු.10,887,095 ලෙස දක්වා තිබීම නිසා රු.644,370 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | එකඟ වෙමි. |

(ආ) නොසැසඳුනු ගිණුම්
---------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------- | ---------------------------- |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 07 ක උපලේඛන අනුව වටිනාකම රු.52,643,535 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.53,281,581 ක් ලෙස දක්වා තිබීම නිසා රු.5,268,628 ක එකතු වෙනසක් පැවතුණි. | ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා උපලේඛන අනුව ශේෂ නිවැරදි කර ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම ගිණුම් 06 කට අදාලව සාරාංශ මුදල් පොත් සහ බැංකු සැසඳුම් ප්‍රකාශ අනුව මුදල් පොත්වල ශේෂ වටිනාකම් රු.10,781,849 ක් වුවද එදිනට මූල්‍ය ප්‍රකාශනවලට අනුව එම ජංගම ගිණුම්වල දැක්වෙන මුදල් පොත්වල ශේෂයන්ගේ එකතු වටිනාකම රු.18,376,498 ක් වුයෙන් රු.7,594,649 ක වෙනසක් විය. | ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමෙන් පසු එක් එක් ජංගම ගිණුම්වලට අදාලව බැංකු සැසඳුම් ප්‍රකාශන සකස් කර ඇත. අදාල ගැළපීම් මූල්‍ය ප්‍රකාශනයේ ජංගම ගිණුම් තුල සිදුවී නොමැති බැවින්, 2020 වර්ෂයේ ගිණුම් තුල මෙම ශේෂය නිවැරදි කර ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම ගිණුම් 03 කට අදාලව මාසික බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වෙන බැංකුවේ ශේෂවල එකතු වටිනාකම් රු.6,942,582 ක් වුවත් එදිනට බැංකුවේ ශේෂ සනාථ කිරීම් ලිපිවල දැක්වෙන එකතු වටිනාකම රු.3,132,415 ක් වුයෙන් රු.3.810,167 ක වෙනසක් විය. | ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ලෙජරයේ ආදායම් ගිණුම් 05 ක එකතු වටිනාකම රු.254,140,668 ක් මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනයේ රු.259,004,923 ක් ලෙස දක්වා තිබීම නිසා රු.18,345,297 ක එකතු වෙනසක් විය. | ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ආදායම් කාණ්ඩ ලෙස ගිණුම් පිළියෙල කිරීමේදී මෙම වෙනස සිදුවී ඇත. |
| (v) | සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ලෙජරයේ වියදම් ගිණුම් 12 ක එකතු වටිනාකම රු.600,116,635 ක් මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනයේ රු.603,512,565 ක් ලෙස දක්වා තිබුණු බැවින් රු.13,673,580 ක එකතු වෙනසක් විය. | ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම වෙනස්කම් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vi) | 2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ නොදැක්වෙන රු.242,741 ක් වූ බැරකම් 02 ක් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයයන් ලෙස ගෙන තිබුණි. | පෙර වර්ෂයේ ගිණුම් සමඟ සසඳා මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුවේ. | ඉදිරි ගිණුම් වර්ෂයේ මෙම දෝෂ සිදු නොවීමට කටයුතු කරමි. |
| (vii) | 2019 දෙසැම්බර් 31 දිනට ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ 200051006126 දරන ස්ථාවර තැන්පතුවේ මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.1,865,959 ක් වුවද එදිනට ශේෂ සනාථ කිරීම් අනුව වටිනාකම රු.1,688,651 ක් වූයෙන් රු.177,308 ක වෙනසක් විය. | ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි ගිණුම් වර්ෂයේ මෙම දෝෂ සිදු නොවීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (viii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ණය ශේෂයන් 06 ක මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.24,027,128 ක් වුවද එදිනට ශේෂ සනාථ කිරීම් අනුව එම ණය ශේෂවල වටිනාකම රු.25,785,351 ක් වූයෙන් රු.7,896,201 ක එකතු වෙනසක් විය. | ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේ ගිණුම් සමඟ අදාළ ශේෂ වෙනස්කම් පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ix) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් පාලන ගිණුම අනුව අයවිය යුතු සේවක ණය රු.28,532,932 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.23,704,368 ක් ලෙස දක්වා තිබීම නිසා රු.4,828,564 ක වෙනසක් හා වෙනත් දෙපාර්තමේන්තු වෙත පියවිය යුතු ණය රු.3,193,730 ක් මූල්‍ය ප්‍රකාශනවල රු.1,661,849 ක් ලෙස දක්වා තිබීම නිසා රු.1,531,881 ක් වෙනසක් විය. | ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි ගිණුම් තුලින් මෙය නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වනවිට 2014 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා විගණන ගාස්තු රු.3,370,050 ක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | මහා සභා තීරණ අනුව ගෙවිය යුතු විගණන ගාස්තුව මාසිකව රුපියල් ලක්ෂය බැගින් ගෙවා අවසන් කිරීමට තීරණය කර ඇත. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වනවිට 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා නිරවුල් නොකල විවිධ ණයහිමි මුදල රු.135,455,780 ක් විය. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම ණය හිමි ශේෂයෙන් 43,754,556 ක් මේ වනවිට නිරවුල් කර ඇත. ඉතිරි ණය ශේෂය ද නිරවුල් කිරීමට කටයුතු කරමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වටිනාකම රු.737,597,791 ක් වු ගිණුම් විෂයයන් 19 කට අදාලව පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | පිළිගනිමි |

| | | | |
|---|---|---|---|
| (ii) | මුද්දර ගාස්තු ආදායම් පැහැදිලිව හඳුනාගත හැකි පරිදි මුද්දර ආදායම් ලේඛනයක් විධිමත්ව නඩත්තු කර නොතිබුණි. එහි මුද්දර ගාස්තු අධි හෝ ඌන වෙන්කිරීම් හා එහි ආදායම් පැහැදිලිව හඳුනාගත නොහැකි විය. | ලේඛන විධිමත්ව පවත්වාගෙන යා යුතුවේ. | විධිමත් ලේඛනයක් සකස් කර 2020.08.31 දිනට පෙර ලබා දීමට කටයතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදලට එරෙහිව ලියාහැර තිබුණු සේවක ණය රු.3,661,688 ක් සම්බන්ධව විස්තරාත්මක තොරතුරු සහ අයවිය යුතුව තිබුණු සේවක ණය කපාහැරීමට හේතු ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ නිවැරදි විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කළ යුතුවේ. | දීර්ඝ කාලයක් සිට පැවති මූල්‍ය ප්‍රකාශන අනුව සේවක ණය ශේෂය 2019.12.31 දිනට සේවක ණය උපලේඛනය අනුව ශේෂය සමඟ සසඳා ආරම්භක ශේෂයේ පැවති වෙනස නිරවුල් කිරීම. |
| (iv) | 0076677550 දරන ජංගම ගිණුමේ 2019 ජනවාරි මාසය සහ මාර්තු සිට අගෝස්තු මාසය දක්වා බැංකු සැසඳුම් ඉදිරිපත් කර නොතිබුණි. | මාසික බැංකු සැසඳුම් ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුවේ. | බැංකු ප්‍රකාශන ලබාගෙන බැංකු සැසඳුම් සකස් කර විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (v) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල මුදල් ගිණුම් 07 ක රු.19,667,827 වටිනාකමක් දක්වා ඇතත් එහි සංයුතිය දැක්වෙන විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කළ යුතුවේ. | මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති සියලුම ජංගම ගිණුම් සඳහා පොදු 58 අකෘතියට අනුව සකස් කරන ලද මුදල් පොත් හා සාරාංශ මුදල් පොත් සකස් කර යාවත්කාලිනව පවත්වාගෙන යනු ලැබේ. ඒවා විගණනය විසින් ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවක ලබාදිය හැකි බව දන්වමි. |
| (vi) | 2019 දෙසැම්බර් 31 දිනට සභාවට එරෙහිව බාහිර පාර්ශවයන් සහ සභාව විසින් බාහිර පාර්ශවයන්ට පවරා තිබුණු නඩු පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකරන ලදී. | විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතුවේ. | නඩු ලේඛන සභාවේ නීති අංශය භාරයේ පවති. නමුත් ඕනෑම අවස්ථාවක පරීක්ෂා කර හැක. |
| (vii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.16,953,617 ක් වූ ස්ථාවර තැන්පත් වටිනාකම් සඳහා ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් නොකරන ලදී. | ශේෂ සනාථ කිරීමේ ලිපි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරි වර්ෂය සඳහා ගිණුම් සකස් කරන අවස්ථාවේදීම මෙම ශේෂ සනාථ කිරීමේ වාර්තා අදාල මූල්‍ය ආයතන මඟින් ලබා ගන්නා බවට විෂය ලිපිකරු දැනුවත් කර ඇත. |
| (viii) | 2014 වර්ෂයේ සිට 2018 වර්ෂයේ ජූනි දක්වා කාලපරිච්ඡේදයේ සිදුවී තිබුණු දළ වශයෙන් රු.40,820,190 ක වැටුප් | තොරතුරු සනාථ කර ගැනීම සඳහා සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | මේ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදු කරන ලෙස පළාත් පාලන කොමසාරිස් වෙත ලිඛිතව |

| | | | |
|---|---|---|---|
| | වංචාවේ නිවැරදි වටිනාකම තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය වැටුප් හා දීමනා බැංකු ප්‍රේෂණ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | | දැනුම් දී ඇත. එම ම මූලික විමර්ශන කටයුතු අවසන් වූ පසු මෙම විස්තර ලබා දීමට කටයුතු කරමි. |
| (ix) | බදු දී තිබූ පොදු වෙළෙඳසැල් කඩ කාමර 02 ක් සභාවේ අනුමැතියකින් තොරව අළුත්වැඩියා කිරීමේදී බදුකරුවන් විසින් ගෙවා තිබූ රු.1,049,629 ක වටිනාකම ලැබිය යුතු කුලියෙන් ලියා හැර තිබුණු නමුත් ඉටුකර තිබුණු වැඩවල ප්‍රමාණය සහ සහතික කළ වටිනාකම් දැක්වෙන තාක්ෂණ වාර්තා ඉදිරිපත් නොකෙරුණි. | අදාළ වටිනාකම් සනාථ කර ගැනීමට තාක්ෂණ වාර්තා ඉදිරිපත් කළ යුතුවේ. | පොදු වෙළඳසැල් අංක.42 උසස් අධ්‍යාපන හා කාර්මික ආයතනය ඇතුලත අළුත්වැඩියා කිරීම වෙනුවෙන් බදුකරුට වැය වූ මුදල තාක්ෂණික වාර්තා හා සභා තීරණ අනුව අදාල හිඟ මුදල් කපා හැරීම් සිදු කර ඇත. |

1.4 අනුකූල නොවීම්
--------------------
නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්
--------------------------------------------------------------------------

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | මහා නගර සභා ආඥා පනත | | | | |
| | 266 වගන්තිය | 6,751,514 | සභා අනුමැතියක් සහ විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව ආදායම් විෂයයන් 03 කින් ලැබිය යුතු ආදායම් ලියා හැර තිබුණි. | මහා නගර සභා ආඥා පනතේ අදාළ වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පිළිතුරු සපයා නොමැත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | | |
| | xix පරිච්ඡේදයේ 5 වගන්තිය | | හිටපු නාගරික කොමසාරිස්වරයා රජයේ නිවසේ පදිංචිවීම වෙනුවෙන් 2009 සැප්තැම්බර් මස සිට | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පිළිතුරු සපයා නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | 2016 ජුනි දක්වා අයවිය යුතු ගෙවල් කුලී රු.205,750 ක් අයකර ගෙන නොතිබුණි. | | |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>------------------------- | | | | |
| (i) | මු.රෙ 189 | 1,807,152 | 2000 වර්ෂයේ සිට 2019 අප්‍රේල් දක්වා කාලපරිච්ඡේදයේ ජංගම ගිණුම් 05 ක රු.248,600 ක් වටිනා අගරු චෙක්පත් සහ මුදල් ඇනවුම් 20 ක් සම්බන්ධ කටයුතු කර නොතිබුණු අතර 2001-2019 දක්වා කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගරු චෙක්පත් සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අගරු වූ චෙක්පත් සම්බන්ධව මු.රෙ 169 වගන්තිය ප්‍රකාරව කටයුතු කර විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (ii) | මු.රෙ.396 | 162,255 | ජංගම ගිණුම් 02 කින් නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොකල වලංගු කාලසීමාව ඉක්මවූ රු.162,255 ක් වූ චෙක්පත් 23 ක් සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ චෙක්පත් 23 සම්බන්ධයෙන් මු.රෙ 396 (ඇ) අනුව කටයුතු කරමි. |
| (iii) | මු. රෙ. 571(i) | | 2019 දෙසැම්බර් 31 දිනට රු.110,650,744 ක් වූ තැන්පතු අතරින් ඉකුත් තැන්පතු හඳුනාගෙන අදාල ලැයිස්තු සකස්කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | තැන්පත් වාර්තාව සකස් කර විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (iv) | මු.රෙ.702(3) | | සමාලෝචිත වර්ෂයට අදාළ කොන්ත්‍රාත් ගිවිසුම් පිටපත්, විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ගිවිසුම් පිටපත් ඉදිරියේ දී විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඈ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ කාර්ය සංග්‍රහය<br>---------------------- | | | | |
| (i) | 2.8.1 වගන්තිය | 41,686,476 | මහා නගර සභාවේ තාක්ෂණික ඇගයීම් කමිටු 04 ක් සඳහා විෂයය ක්ෂේත්‍රයට අදාල විශේෂඥවරුන් සම්බන්ධකර ගෙන නොතිබුණි. | සුවිශේෂී කටයුතු සඳහා විශේෂඥයකු සම්බන්ධ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | විශේෂඥයකුගේ සම්බන්ධ වීමකින් තොරව නාගරික ඉංජිනේරු නිර්දේශය මත කටයුතු කර තිබේ. |
| (ii) | 5.1 වගන්තිය | 32,700,000 | තාක්ෂණික පිරිවිතරයන්, නිර්ණායකයන් හා අවශ්‍ය අවම ප්‍රමිතීන් සඳහන් නොකරමින් කසළ දහන යන්ත්‍රය සහ සූර්ය බල පද්ධතියන් ප්‍රසම්පාදනය සඳහා ලංසු ලේඛන පිළියෙල කර තිබුණි. | මෙවැනි කටයුතු සඳහා විධිමත් ප්‍රසම්පාදනයක් සිදුකිරීම හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | විශේෂඥයකුගේ සම්බන්ධ වීමකින් තොරව නාගරික ඉංජිනේරු නිර්දේශය මත කටයුතු කර තිබේ. |
| (iii) | 5.4.4 වගන්තිය | 1,700,000 | ඝණ අපද්‍රව්‍ය දහන යන්ත්‍රයක් ස්ථාපිත කිරීම සඳහා තෝරාගත් ආයතනයට අත්තිකාරම් ලබාදීමේ දී ව්‍යාපෘති වටිනාකමෙන් සියයට 30 ක වැඩ අත්තිකාරම් ගෙවීම වෙනුවට අත්තිකාරම් සුරක්ෂණයක් නොමැතිව සියයට 50 ක් ගෙවීම කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මෙය ඉතා කඩිනමින් සවිකර ගත යුතු බැවින් අදාළ ආයතනයට 30% අත්තිකාරම් යටතේ ඉටුකර ගැනීමට නොහැකි වූ බැවින් 50% අත්තිකාරම් අවශ්‍ය බව දැනුම්දුන් බැවින් අදාළ ගෙවීම සභාව තීරණය කරන ලදී. |
| (iv) | 6.2.2 ඡේදය | 8,500,000 | සන අපද්‍රව්‍ය දහනය සඳහා යන්ත්‍රයක් ස්ථාපිත කිරීමේ ප්‍රසම්පාදන ලංසු ඉදිරිපත් කිරීම සඳහා දින 21 ක අවම කාලය ලබාදී නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අදාළ ඡේද ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | කෙටි කාලයක් තුළ විසඳුමක් යෙදිය යුතු වූ සුවිශේෂී වූ ගැටළුවක් නිසාවෙන් යෝජනා කැඳවීමක් වූ බැවින් දින 16 ට සීමා වන පරිදි යෝජනා කැඳවන ලදී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (v) | 7.1, 7.7, 7.8 ඡේද | 32,700,000 | කසල දහනාගාරය සහ සූර්ය බල පද්ධතිය ස්ථාපිත කර සේවයෙන් පසු වගකීම් හා සේවා කොන්දේසි ගිවිසුම්වලට ඇතුළත් කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අදාළ ඡේද ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වගකීම් හා සේවා සම්බන්ධ ගිවිසුම් (ප්‍රසම්පාදනයේ දී ඉදිරිපත් කල පරිදි) වලට අදාලව ස්ථාපිත කිරීම් අවසන් කිරීමෙන් පසුව ගිවිසුම්වලට එළඹීමට කටයුතු කරනු ලැබේ. |
| (vi) | 3.10 වගන්තිය | 7,499,996 | පෙරටු කාර්යාලය ඉදිකිරීම සඳහා ලංසු කැඳවීමේදී ද්විත්ව කවර ලංසු කැඳවීමේ ක්‍රමය අනුගමනය කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අදාළ ඡේද ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මහා නගර සභා ආඥා පනතේ 252 අධිකාරිය යටතේ ස්ථාපිත ස්වාධීන ආයතනයක් බැවින් ඒ අනුව මහා නගර සභා අරමුදලින් භාණ්ඩ හා සේවා ලබා ගැනීමට ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවලට අදාලව ප්‍රසම්පාදන කමිටු තීරණය කරනු ලබයි. |

1.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නියෝජ්‍ය නගරාධිපතිවරයාට ඉන්ධන දීමනාවක් ලබාදීම සඳහා නෛතික ප්‍රතිපාදන නොතිබිය දී 2018 අප්‍රේල් සිට 2019 දෙසැම්බර් දක්වා මසකට ඩීසල් ලීටර් 200 බැගින් ඩීසල් ලීටර් 4200 ක් සඳහා රු.418,800 ක දීමනාවක් ලබාදී තිබුණි. | අනුමැතිය රහිත ගෙවීම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සභා තීරණ මත ගෙවීම් කර ඇත. |
| (ආ) | 2018 අගෝස්තු 29 දිනැති අංක 2086/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනය ප්‍රකාරව නගරාධිපති කාර්යමණ්ඩල පෞද්ගලික ලේකම් හා මහජන සම්බන්ධතා නිලධාරි දෙදෙනාට රු.25,000 ක උපරිමයකට යටත්ව දීමනා ගෙවිය හැකි වුවද 2018 අගෝස්තු සිට 2019 දෙසැම්බර් දක්වා රු.35,000 බැගින් මාසිකව ගෙවීම් කර තිබුණි. තවද එම ගැසට් නිවේදනය ප්‍රකාරව නෛතික ප්‍රතිපාදන නොතිබිය දී පෞද්ගලික ලේකම් වෙත 2019 අප්‍රේල් සිට මසකට රු.5,000 බැගින් දුරකථන දීමනා ගෙවීම් කර තිබුණි. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. වැඩිපුර ගෙවීම් අය කළ යුතුවේ. | සභා තීරණ මත ගෙවීම් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පළාත් පාලන ආයතනවල සේවය කරන දීපව්‍යාප්ත සේවාවල නිලධාරීන්ට සහ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ට වැටුප් හා දීමනා ගෙවීමට මහා නගර සභා ආඥා පනත (252 අධිකාරය) 188 (අ) සිට (ණ) දක්වා වගන්තිවලින් බලය ලබාදී නොතිබියදී හා විෂයභාර අමාත්‍යවරයා හෝ ආණ්ඩුකාරවරයාගේ පූර්ව අනුමැතියෙන් තොරව නිලධාරීන් 32 දෙනෙකුට 2018 වර්ෂය වෙනුවෙන් දිරිදීමනා ලෙස රු.3,496,082 ක් ගෙවා තිබුණි. | දීමනා ගෙවීම් සඳහා විධිමත් අනුමැතීන් ලබාගත යුතුවේ. | සහා අනුමැතිය යටතේ ගෙවීම් කර ඇත. ඉදිරියේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කරමි. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මහා නගර සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.47,891,094 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,113,853 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට සහ ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම් , රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 138,211,000 | 78,224,708 | 81,590,115 | 92,701,898 | 65,500,000 | 68,552,914 | 63,301,193 | 90,919,302 |
| (ii) | කුලී | 97,096,000 | 26,371,089 | 41,981,929 | 49,905,016 | 24,650,000 | 25,332,031 | 19,906,664 | 47,135,639 |
| (iii) | බලපත්‍ර ගාස්තු හා සේවා | 44,422,000 | 15,951,670 | 38,187,004 | 1,844,515 | 15,000,000 | 15,632,224 | 14,698,340 | 3,133,877 |
| (iv) | වෙනත් ආදායම් | 459,965,130 | 50,000,000 | 386,135,044 | 28,641,342 | 40,573,246 | 40,573,246 | 74,615,304 | 28,905,061 |
| | | 739,694,130 | 170,547,467 | 547,894,092 | 173,092,771 | 145,723,246 | 150,090,415 | 172,521,501 | 170,093,879 |

2.2.2 වරිපනම් හා බදු

-----------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------- | --------------------------- |
| (අ) | 2009 වර්ෂයේ තක්සේරුව පදනම්ව සමාලෝචිත වර්ෂයට වරිපනම් බදු අයකර තිබුණි. | කාලානුරූපීව වරිපනම් බදු සංශෝධනය කරගත යුතුවේ. | මහා නගර සභාව මේ වරිපනම් බදු ප්‍රදේශ සිතියම්ගත කර ඇත. |
| (ආ) | වාර්ෂික වරිපනම් බදු බිල්කිරීම් රු.79,367,023 ක් වූ නමුත් 2019 දෙසැම්බර් 31 දිනට හිඟය රු.91,011,029 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ අයකර ගැනීමට කටයුතු කරමි. |

2.2.3 කුලී

-----

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------- | ----------------------------- |
| (අ) | සමාලෝචිත වර්ෂයට වාර්ෂික කඩකුලී බිල්කිරීම් රු.20,242,227 ක් වු අතර 2019 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි කඩකුලී රු.43,592,735 ක් විය. | හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සභාවට යොමුකර එහි තීරණ ප්‍රකාරව ඉදිරි කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට වාර්ෂික පොදු වෙළඳසැල් කුලී බිල්කිරීම් රු.5,828,871 ක් වු අතර 2019 දෙසැම්බර් 31 දිනට හිඟහිටි පොදු වෙළඳසැල් කුලී රු.3,579,252 ක් විය. | හිඟහිටි කුලී ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සභාවට යොමුකර එහි තීරණ ප්‍රකාරව ඉදිරි කටයුතු කරමි. |
| (ඇ) | සභාව සතු කඩකාමර වසර 05 කට වරක් තක්සේරු කල යුතු වුවද පොදු වෙළඳසැල අදියර I හා II කඩකාමර සහ අනෙකුත් කඩ කාමර සඳහා 1999 තක්සේරුව පදනම් කරගෙන කුලී අය කරමින් පැවතුණි. | කඩිනමින් නව තක්සේරු මත කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2020 ජනවාරි මස සිට මහා සභාව වෙත යොමු කරමින් තාවකාලික තක්සේරු මත කුලී අයකර ගැනීමට කටයුතු කරමි. |

2.2.4 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙළඳ බලපත්‍ර ගාස්තු හිඟය රු.1,193,675 ක් විය. | මහා නගර සභා ආඥා පනතේ (252) අධිකාරිය ප්‍රකාරව කටයුතු කර අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සමාලෝචිත වර්ෂයේ වෙළඳ බලපත්‍ර හිඟය පියවා ගැනීම සඳහා බලපත්‍ර නොගෙවූ ආයතනවලට මේ වන විටත් නඩු පැවරීමට කටයුතු කර ඇත. |

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙක් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු උසාවි දඩ රු.674,975 ක් හා මුද්දර ගාස්තු රු.25,189,888 ක් විය. | ලැබිය යුතු සියළු උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සුදුසු ව්‍යාපෘති වාර්තා සකස් කර අයවිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු ලබාගැනීමට කටයුතු කරමි. |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

මහා නගර සභා ආඥා පනතේ 04 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව වූ නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මහා නගර සභා අඥා පනතේ 272 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 34 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වූ නමුත් 2019 දෙසැම්බර් 31 වනවිට පනවා තිබුණු අතුරු ව්‍යවස්ථා පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළ යුතුවේ. | කරුණු කිහිපයක් යටතේ ව්‍යවස්ථා කෙටුම්පත් කරණය කර ඇති අතර, පවතින දෝෂ නිවැරදි කිරීමෙන් පසු ගරු ආණ්ඩුකාරතුමා වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය. |

(ආ) කාර්ය හා කර්තව්‍යයන් ඉටු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ නාගරික පශු වෛද්‍ය ඒකකයෙන් ඉටුකළ යුතුව තිබෙන මුලික කාර්යය 04 ක් සහ ඊට අදාල උප කාර්යයන් 16 ක් ඉටුකර නොතිබුණි. | අදාළ අංශ මගින් ඉටුකළ යුතු කාර්යයන් ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | නාගරික පශු වෛද්‍ය ඒකකයේ කාර්යයන් අතුරින් කොටසක් ඉටුකර තිබේ. |
| (ii) | මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්ගේ කළයුතු ඉදිරි වැඩ සටහන් අනුමත කිරීම සිදුකර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ආහාර සුරක්ෂිතභාවය පිළිබඳ කාර්යය සහ කර්තව්‍ය ද ඉටුකර නොතිබුණි. | කාර්යයන් ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදාළ මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කිරීමට උපදෙස් ලබාදී ඇත. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහා නගර සභා බල ප්‍රදේශයේ එකතු වන කසළ, නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවට අයත් කිරික්කුලම කසළ කළමනාකරණ මධ්‍යස්ථානයට බැහැර කර තිබුණු අතර අවිධිමත් කසළ බැහැර කිරීම හේතුවෙන් ප්‍රදේශ වාසීන්ගේ විරෝධතාවය සහ පවතින නඩු කටයුත්තක් නිසා එම ස්ථානයට කසල බැහැර කිරීම නතර කර තිබුණි. තවදඑකතු වී තිබුණු පොලිතින් සහ ප්ලාස්ටික් යනාදී නොදිරන කසළ එම භූමියේ කඳු ආකාරයෙන් ගොඩගසා තිබුණි. | අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් පිළියෙල කර අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත්ව සිදුකිරීමට කටයුතු කළ යුතුවේ. | එකතු කරනු ලබන දිරන කසළ දඹුල්ල නගරය සඳහා කාබනික අංගනයට බැහැර කිරීමටද, නොදිරන කසළ පුත්තලම INCC ECOCYCLE LANKA ආයතනයට යොමුකිරීමටද, කීරික්කුලම අංගනය කසළ පස් දමා වසා දැමීමටද කටයුතු කර ඇත. |

(ඈ) පාරිසරික ගැටළු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | කුඹිච්චන්කුලම වැවේ වාන් වතුර මල්වතු ඔයට මුදා හරින ඇළ මාර්ගය දෙපස ඇති සේවා මාර්ගද අවහිර වන පරිදි විශාල වශයෙන් අනවසර ඉදිකිරීම් කර තිබුණි. පෞද්ගලික | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුවේ. | කුඹිච්චන්කුලම වැවේ මල්වතු ඔයට ගලා යන ඇළ මාර්ග හා එහි සේවා මාර්ගය අවහිර කර තිබූ හඳුනා ගන්නා ලද ස්ථානවල තිබූ |

| | | | |
|---|---|---|---|
| | ආයතනයක් විසින් ඇළ ඉවුර මත ආධාරක කොන්ක්‍රීට් කණු යොදා ඒ මත තාප්ප හා බිත්ති බැඳ ඇළ රක්ෂිතය අනවසරයෙන් අල්ලා ගෙන තිබීම හේතුවෙන් සේවා මාර්ග අහිමි වී ඇති අතර එය ඇළ දෙපස ජීවත්ව සිටින ජනතාවට ප්‍රබල සාමාජීය ප්‍රශ්නයක් බවට පත්වී තිබුණි. | | ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කර ඇත. |
| (ii) | ප්‍රසිද්ධ හෝටල් හිමියන් කිහිපදෙනෙකු විසින් සංචාරකයින් සඳහා බෝට්ටු සවාරි සංවිධානයට මල්වතුඔය රක්ෂිතය භාවිතා කර තිබූ අතර රක්ෂිතවල ඉදිකර ඇති හෝටල් සඳහා නගර සභාවෙන් හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. තවද බෝට්ටු සවාරි සඳහා නගර සභාවෙන් වෙළඳ බලපත්‍ර ද ලබාගෙන නොතිබුණි. | මල්වතුඔය සහ රක්ෂිතය තුළ අනවසර ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුවේ. | මෙම හෝටල් හා බෝට්ටු සවාරිය සඳහා අනුමැතිය ලබාදීමට කටයුතු කරමි. |
| (iii) | ලැගුම්හල් බොහොමයක අභ්‍යන්තර ශුද්ධ මානයන් කලාපීයකරණය සැලැස්මට අනුකූල නොවීම හේතුවෙන් එකී ලැගුම්හල් වල සනීපාරක්ෂක ගැටළු මතු වී තිබුණි. | ලැඟුම්හල්වල සනීපාරක්ෂක පහසුකම් විධිමත් කිරීමට කටයුතු කළ යුතුවේ. | නේවාසික ගොඩනැගිලි වශයෙන් අනුමත කර ගන්නා පෞද්ගලික ස්ථාන පසුව අවශ්‍යතාවය මත වාණිජ කටයුතු සඳහා සුදුසු වන අයුරින් සැලසුම් සංශෝධනය කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. |
| (iv) | නගර සභාව විසින් පාලනය කරනු ලැබූ පුරහල පෙදෙස ක්‍රීඩා භූමිය ඛණ්ඩනය වන සේ මැදින් මාර්ගයක් යොදා භූමියෙන් කොටසක් අනවසර පදිංචිකරුවන් විසින් අත්පත් කරගෙන වෙළඳ ව්‍යාපාර හා නිවාස ඉදිකිරීම නිසා ශාරීරික සුවතා කටයුතු සඳහා මහජනතාවට ලැබී තිබුණු අවස්ථාව අහිමි වී තිබුණි. | අනවසර අල්ලා ගැනීම් සහ ඉදිකිරීම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුවේ. | අවිධිමත් ආකාරයේ ඉදිකිරීම් සඳහා යොමු වී තිබූ අනවසර ඉදිකිරීම් යටතේ ඉවත් කිරීමට කටයුතු කර ඇත. |
| (v) | නාගරික සංවර්ධන අධිකාරියේ 1985 මාර්තු 20 දිනැති අංක 8/1/38 දරන චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුව අනුමත කළ ගොඩනැගිලි සැලැස්මට අනුකූල නොවන ලෙස පුරහල පෙදෙස 09 වන පටුමගෙහි අංක 460 C දරන ස්ථානයේ ඉදිකිරීම් කටයුතු සිදුකර තිබුණි. | සැලසුම්වලට අනුකූල නොවන ඉදිකිරීම් සම්බන්ධව නෛතික පියවර අනුගමනය කළ යුතුවේ. | පිළිතුරු සපයා නැත. |

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහා නගර සභාව විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව ලඟාකර ගතයුතු අරමුණු සහ ඉලක්ක, නිර්නායකයන් පිහිටුවීම වගකීම් පැවරීමේ කාර්යයන් ඉටුකර නොතිබුණි. | තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ අයවැය ලේඛනය මඟින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක නිර්නායකයන් ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම් කර ඇත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කීරික්කුලම පිළිසරු ව්‍යාපෘතිය සඳහා යොදවා තිබූ එක්ස්කැවේටර් යන්ත්‍රය ගිනි ගැනීම සම්බන්ධයෙන් පැවැත්වූ මූලික විමර්ශනයේ දී හඳුනාගත් රු.මි.3.3 ක අලාභයෙන් හතරෙන් එකක වටිනාකම වන රු.825,000 ක් අදාල නිලධාරීන්ගෙන් අයකර ගෙන නොතිබුණි. | විමර්ශන වාර්තාව ප්‍රකාරව කටයුතු කර අදාළ මුදල් අදාළ පුද්ගලයාගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම ගටළුව සම්බන්ධයෙන් පැවැත්වූ විමර්ශන වාර්තාව අනුව අලාභ මුදල අදාළ නිලධාරීගෙන් අයකිරීමට කටයුතු ඇත. |
| (ආ) | හිටපු නාගරික කොමසාරිස්වරයා 2016 ජුනි මාසයේදී ස්ථාන මාරුවී ගොස් ඇතත් 2020 ජුනි මාසය දක්වා නිල නිවසින් ඉවත් වී ගොස් නොතිබුණු අතර එම කාලයට කුලී සහ දණ්ඩන කුලී අයකර නොතිබුණි. | නිල නිවාසය ආපසු ලබාගැනීමට හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | නාගරික කොමසාරිස්ට වෙන් කර තිබුණු උපලේඛනගත නිවසෙහි පදිංචිව සිටින හිටපු නාගරික කොමසාරිස් 2016 ජුනි මස සිට පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු වී ගොස් ඇත. පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ, නාගරික කොමසාරිස් ලෙස පැමිණ ඇති අතර, නිලධාරින් දෙදෙනාගේ එකඟතාවය මත නිල නිවාස දෙකෙහි පදිංචි සිට ඇති අතර, පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ ලෙස පත්වී ගිය නිලධාරියාගෙන් එම කාලය වෙනු වෙන් නිල නිවාස කුලී අයකර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා සිදු වී තිබුණු මූල්‍යමය අක්‍රමිකතාවයන් දෙකකින් සභා අරමුදලට වූ රු.47,174,493 ක් ලෙස ගණනය කල මූල්‍යමය අලාභය පියවා ගැනීම සඳහා නෛතික පියවර ආරම්භ කර නොතිබුණි. | අදාළ විමර්ශන කඩිනමින් නිමකර වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව කටයුතු කිරීම හා සභාවට වූ පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කරමින් පවතින බැවින් අදාළ මූල්‍ය අලාභය නිශ්චිතවම හඳුනාගෙන නොමැත. |
| (ඈ) | අනුරාධපුර මහා නගර සභාවේ සේවය කර 2013 වර්ෂයේ වෙනත් ආයතනයකට ස්ථාන මාරුවී ගොස් තිබුණු සේවකයෙකුට එදින සිට 2018 ජූනි මස දක්වා කාලයට ගෙවා තිබූ රු.1,816,557 ක වැටුප් සහ දීමනා පියවා ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදාළ විමර්ශන කඩිනමින් නිමකර පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කරමින් පවතින බැවින් අදාළ මූල්‍ය අලාභය අය කර ගැනීමට මෙතෙක් තීරණයක් ලැබී නොමැත. |

3.3 මානව සම්පත් කළමනාකරණය

(අ) සේවක මණ්ඩල පුරප්පාඩු හා අතිරික්ත

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2019 දෙසැම්බර් 31 දිනට ප්‍රාථමික මට්ටමේ සේවකයින් 70 කගේ අතිරික්තකයක් ද, ද්විතීක මට්ටමේ තනතුරු 10 ක පුරප්පාඩු 60 ක් ද, තෘතියික මට්ටමේ තනතුරු 02 ක පුරප්පාඩු 02 ක් ද හා ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 03 ක පුරප්පාඩු 03 ක් ද විය. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අනුරාධපුර මහා නගර සභාවේ දෛනිකව මාර්ග හා කාණු පවිත්‍ර කිරීමේ කටයුතු සඳහා දැනට සේවයේ යොදවා ඇති පිරිස් ප්‍රමාණවත් නොවන නිසාවෙන් අනියම් හා ආදේශක සේවකයින් සේවයේ යොදවා ගෙන ඇත. |
| (ii) | අනියම් වැටුප් හා දීමනා ලබන සේවකයන් 97 දෙනෙකු නිත්‍ය තනතුරු 25 ක වැඩ බැලීම සඳහා යොදවාගෙන 2019 වර්ෂයේදී වැටුප් හා දීමනා ගෙවීම සඳහා රු.44,028,992 ක් වැයකර තිබුණි. | වර්තමාන කාර්යභාරයට අවශ්‍යවන කාර්ය මණ්ඩලයක් අනුමත කරවාගෙන බඳවාගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ පිළිබඳව 2016 වර්ෂයේ සිට ඉල්ලීම් ඉදිරිපත් කර ඇතත් අවශ්‍ය කාර්යමණ්ඩලය අනුමත කර දීමට කටයුතු කර නොමැත. අවම තරමින් පුරප්පාඩු හෝ සම්පූර්ණ කර දී නොමැත. ඒ හේතුව නිසා මෙම තත්ත්වය පැන නැගී ඇත. |

(ආ) සේවක ඇප

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1991 නොවැම්බර් 03 දිනැති අංක 04/1999 දරන උතුරුමැද පළාත් ප්‍රධාන ලේකම්ගේ ආයතන චක්‍රලේඛයේ 03 වගන්තිය ප්‍රකාරව දැනට සේවයේ නියුතු, ඇප මුදල් තැන්පත් කල යුතු නිලධාරීන්ගෙන් ලබාගත යුතු ඇප මුදල් රු.235,000 ක් ලබාගෙන නොතිබුණි. | අදාළ නිලධාරීන්ගෙන් ඇප ලබාගැනීමට කටයුතු කළ යුතුවේ. | නොපමාව අයකර තැන්පත් කිරීමට කටයුතු කරමි. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මහා නගර සභාව පරිහරණය කරන වාහන 10 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ වාහනවල අයිතිය පවරාගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු සපයා නොමැත. |

3.4.2 නිශ්ක්‍රීය වත්කම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී මහා නගර සභාවේ ගොඩනැඟිලි 05 ක ස්ථාපිත කර තිබුණු රු.24,200,000 ක් වටිනා සූර්යය බල පද්ධතීන් 05 ක් 2020 ජුනි 22 දින වනවිටත් නිශ්කාර්යව පැවතුණි. | අදාළ සූර්යබල පද්ධතීන් ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා කටයුතු කළ යුතුවේ. | පිළිතුරු සපයා නොමැත. |

3.4.3 වාර්ෂික භාණ්ඩ සහ තොග සමීක්ෂණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සහ තොග සමීක්ෂණය සිදුකර නොතිබුණි. | නියමිත කාලය තුළ භාණ්ඩ සමීක්ෂණ සිදුකර සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතුවේ. | 2020.08.30 පෙර සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කරමි. |

3.5 ආර්ථික නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මධ්‍යම පරිසර අධිකාරියේ අන්තර් ප්‍රමිත අනුව සහ 2019 ජුනි 05 දින අංක 2126/36 දරන 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ නියෝග අනුව දහනාගාරයේ කසළ දහන කටයුතු පාලන ප්‍රමිතීන්ට අනුව පරිසර හිතකාමී ලෙස සිදුකල යුතු වුවද අදාළ අවම උෂ්ණත්වයකින් සහ ධාරණ කාලයකින් යුතුව ක්‍රියාත්මක බව සනාථ කිරීමට අවශ්‍ය දත්ත මාපකයන් සවිකර නොතිබුණි. එමෙන්ම දාහකය මගින් කසළ දහනය කිරීමේදී අවට ප්‍රදේශය කළු දුමාරයෙන් වැසී යන බැවින් ප්‍රමිතිගත අවම උෂ්ණත්වයක් සහ ධාරණ කාලයකින් කසළ දාහකය ක්‍රියාත්මක නොවන බව අනාවරණය විය. ඒ අනුව මධ්‍යම පරිසර අධිකාරියේ නියමයන්ට හා නිර්ණායකයන්ට අනුකූල නොවූ දහනාගාරය සහ එය ස්ථාපිත කිරීමට වැයකර තිබුණු රු.10,408,232 ක මුදල ඵලදායී නොවන වියදමක් වී තිබුණි. | සම්මත ප්‍රමිති අනුව මෙවැනි ව්‍යාපෘති පවත්වාගත යුතුවේ. | කසළ දාහකය සම්බන්ධයෙන් පරිසර ගැටළු මතු වෙතැයි සැලකෙන ගැටළු සම්බන්ධයෙන් සාකච්ඡා මාර්ගික තීරණ ගැනීමට පියවර ගන්නා බව දන්වා සිටිමි. ඉදිරියේදී මහා නගර සභාවට මූල්‍ය අලාභයක් සිදු නොවන පරිදි මෙම ගනුදෙනුව සහ අදාල ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා තීරණ ගැනීමට කටයුතු කරමින් පවති. |

3.6 අවිධිමත් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | පෙරටු කාර්යාලය ඉදිකිරීමේ ව්‍යාපෘතිය තාක්ෂණික දැනුම ඇති නිලධරයන්ගෙන් සමන්විත ඇගයීම් කමිටුවකට යොමු නොකර මිලගණන් ඉදිරිපත් කර තිබූ එකම ආයතනයට රු.7,499,996 ක මිලකට පිරිනමා තිබුණි. | විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කළ යුතුවේ. | පෙරටු කාර්යාලය ඉදිකිරීම සම්බන්ධයෙන් නාගරික ඉංජිනේරු හා සභා තීරණ මත කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පෙරටු කාර්යාලය සඳහා වායු සමීකරණ යන්ත්‍ර 04 ක් මිලදී ගැනීමේදී අවම මිලගණන් ඉදිරිපත් කර තිබුණු ආයතනයෙන් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කමිටුව නිර්දේශ කර තිබියදී වැඩිම මිලගණන් ඉදිරිපත් කර තිබුණු ආයතනයෙන් මිලදී ගැනීම නිසා රු.173,356 ක මූල්‍යමය අලාභයක් සිදුවී තිබුණි. | ප්‍රසම්පාදන කමිටු නිර්දේශ අනුව කටයුතු කළ යුතුවේ. | පිළිතුරු සපයා නැත. |

3.7 හඳුනාගත් පාඩු

-----------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු එකතු කළ අගය මත බදු මුදල් (VAT) වලට හිලව් කර ගතයුතු 2019 ජනවාරි සිට ජූලි මාසය දක්වා කාලපරිච්ඡේදයේ ගෙවීම් කර තිබුණු (VAT) බදු රු.374,913 ක් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. | නියමිත කාල වකවානු තුල ප්‍රතිපූර්ණය කරගත යුතුවේ. | සමාලෝචිත වර්ෂය සඳහා මිලදී ගැනීම් සිදු කළද අදාල ගෙවීම් කටයුතු සිදු කරනු ලබන්නේ ඊට පසුවය. සභාවේ යම් යම් අවස්ථාවලදී ඇති වී තිබූ මූල්‍ය අපහසුතා හේතුවෙන් අදාල සැපයුම්කරුවන්ට ගෙවීම් කිරීම ප්‍රමාද වී ඇත. එබැවින් වර්ෂයකට වඩා වැඩි කාලයක් ගතවූ බිල්පත් වටිනාකම වැට් බදු ගෙවීම් කරන අවස්ථාවෙදී ප්‍රතිපූර්ණය කර ගත නොහැක. |
| (ආ) | මහනාම උයන කාණු පද්ධතිය ඉදිකිරීමට අදාළ ගෙවීම් සිදුකිරීමේදී අදාළ අත්තිකාරම් මුදල සම්පූර්ණයෙන් අයකර නොගැනීම නිසා රු.307,454 ක පාඩුවක් සිදුව තිබුණි. | අදාළ පාඩුව වගකිව යුතු අයගෙන් අයකරගත යුතුවේ. | මූලික විමර්ශනයක් සිදු කර ඉතිරි මුදල වගකිව යුතු පාර්ශ්වයන්ගෙන් අය කර ගැනීමට කටයුතු කරමි. |

04. ගිණුම්කටයුතුභාවයහා යහපාලනය

--------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

------------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 2015 මාර්තු 18 දිනැති අංක 04/2015 දරන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව සෘජුවම වගකියනු ලබන අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර වාර්තා ලබාගෙන නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අනුරාධපුර මහා නගර සභාව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර ඇත. නමුත් අභ්‍යන්තර විගණන වාර්තා රජයේ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොමැති බැවින් ඉදිරියේදී යොමු කරන ලෙස අදාළ නිලධාරින් දැනුවත් කර ඇත. |

4.2 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | අවම වශයෙන් කාර්තුවකට 1 ක් වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | අභ්‍යන්තර විගණන නිලධාරි වෙත විගණන කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබා දී ඇත. |

4.3 නොවිසඳී ඇති නිරීක්ෂණ හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016-2020 කාලපරිච්ඡේදයේ නිකුත් කල රු.127,945,772ක ගණනය කළ හැකි මුල්‍යමය වටිනාකමක් සහිත විගණන විමසුම් 21ක් සඳහා 2020 මැයි 27 දක්වා පිළිතුරු සපයා නොතිබුණි. | විගණන විමසුම් සඳහා නියමිත කාලය තුල පිළිතුරු සැපයීම කළ යුතුවේ. | විධිමත් විගණන විමසුම් ලේඛනයක් නොමැති වීම හේතුවෙන් හිඟ හිටි විගණන විමසුම් පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ අපහසුතාවක් පැවති අතර 2018 වර්ෂයේ විගණන වාර්තාවේ සඳහන් කර ඇති පරිදි විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීම සිදු කරන ලදි. |